Alcohol and Drug Information Centre

ADIC

No.40/18, Park Road, Colombo 05, Sri Lanka.
Tel: +94 11 2584416,+94 11 2592515, Fax: +94 112508484
Email: info@adicsrilanka.org
Web site: http//www.adicsrilanka.org

2019 ඔක්තෝබර් 07

# මාධ්‍ය නිවේදනය

## මුදල් අමාත්‍යාංශය හිතුමතේ රටේ මද්‍යසාර ප්‍රතිපත්ති වෙනස් කිරීම ප්‍රජාතන්ත්‍ර විරෝධි ක්‍රියාවක්

පවතින රජය යටතේ පසුගිය කාල වකවානුව තුළ මද්‍යසාර සම්බන්ධ ප්‍රතිපත්ති වෙනස් වූ ආකාරය පහත පරිදි වේ.

- 2017 වසරේ ඇති වූ ගංවතුර හේතුවෙන් බියර් සමාගම් වෙත බදු සහන ලබාදීම නිසා රජයට අත්කර ගැනීමට තිබූ බදු මුදල් අහිමි වීම
- 2017 වසරේ අවසානයේ බියර් මත පනවා තිබූ සුරා බදු මුදල අඩු කිරීම නිසා පමණක් එක් බියර් බෝතලයකින් සිදු වූ පාඩුව රු 76.40කි මේ අනුව 2018 වසරේ විකුණූ මුළු බියර් බෝතල් ප්‍රමාණයට අනුව ආණ්ඩුවට අහිමි වූ මුදල රු 22,920,000 (රු මිලියන 23) වේ.
- 2019 වසරේ ද අයවැය තුළින් බියර් සඳහා සුරා බදු වැඩිකිරීම ප්‍රමාණවත් නොවීම නිසා ආණ්ඩුවට අමතරව ලබා ගත හැකිව තිබූ විශාල මුදලක් අහිමි වූ අතර එහි වාසිය බියර් සමාගම ලබා ගනිමින් ඔවුන්ගේ ආදායම වැඩි කරගෙන ඇත.
- මෙවර අයවැයේදී ඇතැම් මද්‍යසාර වර්ග සඳහා බදු වැඩි වූවද, ගල් අරක්කු සඳහා බදු වැඩි නොකරන ලදී. එම හේතුවෙන්ද රු. මිලියන 500ක පමණ අමතර ලාභයක් මාර්තු මසදී පමණක් ලබාගැනීමට අරක්කු සමාගම් සඳහා මෙතුලින් හැකියාව ලැබී ඇත.

ඉහත සඳහන් තීරණ වලට අමතරව 2019.10.02 දින නිවේදනය කරනු ලැබුවේ මද්‍යසාර බෝතල් ළග තබා ගැනීමේ සීමාව ලීටර් 7.5 සිට ලීටර් 80 දක්වා (එය ආසන්න වශයෙන් බෝතල් 10 සිට 80 දක්වා) වැඩි කර ඇති බවයි.

ඉහත සඳහන් සියල්ල සලකා බැලූ කල පෙනි යන්නේ ඉහත සඳහන් ප්‍රතිපත්තිමය වෙනස්කම් මහජනයාගේ තිබූ දැවැන්ත ඉල්ලීමක් මත හෝ රටේ දැවෙන ප්‍රශ්ණයක් මත සිදුවූ ඒවා නොවන බවයි. එපමණක් නොව ඉහත සියල්ල මද්‍යසාර කර්මාන්තයට වාසි වන ආකාරයටම සිදුවීම රටේ ආර්ථිකයට විශාල හානියක් වූ බවයි. (මද්‍යසාර හේතුවෙන් 2015 වසරේ දැරීමට සිදුවූ සෞඛ්‍ය පිරිවැය පමණක් රුපියල් බිලියන 120 කට ආසන්න වේ. )

අප රටේ මද්‍යසාර භාවිතය වයස අවු 18ට වැඩි පිරිමි ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස 35% වේ. එනම් වැඩි බහුතරය මද්‍යසාර භාවිතා නොකරන පිරිස වේ. එමෙන්ම අප රට මද්‍යසාර සංස්කෘතියක් ඇති රටක්ද නොවේ. එවන් පසුබිමක මෙවැනි තීරණ හරහා රටේ වැඩි ප්‍රමාණයකට මද්‍යසාර භාවිතය හුරු කරවීමත් මද්‍යසාර සංස්කෘතියක් රට තුල නිර්මාණය කිරීමත් මෙවැනි ප්‍රතිපත්ති හරහා සිදුවීම වැළැක්විය නොහැකිය. එය දේශීය හා විදේශීය මද්‍යසාර කර්මාන්තවලද බලාපොරොත්තු ඉටුකර දීමකි.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ හා සෞඛය අමාත්‍යාංශයේ දත්ත අනුව, ශ්‍රී ලංකාවේ සිදුවෙන මරණවලින් සෑම මරණ 10කින් 8 ක්ම සිදුවන්නේ වළක්වාගත හැකි මරණ වලිනි. මෙම මරණ ඇති වීමට බලපාන ප්‍රධාන සාධක අතර පිළිවෙලින් දුම්පානය සහ මද්‍යසාර භාවිතය පළමු සහ දෙවන ස්ථාන ගනු ලබයි. දිනකට ආසන්න වශයෙන් මද්‍යසාර හේතුවෙන් සිදුවෙන මරණ සංඛ්‍යාව 40-50ත් අතර ප්‍රමාණයක් වේ . එවැනි ගැටළු සහගත මද්‍යසාර භාවිතය පිළිබඳ තිරණ ගැනීමේදී ඒ පිළිබඳ විද්‍යාත්මක හැදෑරීමක් ඇති සෞඛ්‍ය අමාත්‍යාංශය, දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (NATA) වැනි ආයතන සමග කිසිදු සාකච්ඡාවකින් තොරව මුදල් අමාතං්‍යශයට අවශ්‍ය ආකාරයට පමණක් සිදුකිරීම, මුදල් අමාතං්‍යශයේ ක්‍රියාකලාපය ගැටළු සහගත බව පෙනීයයි.

එබැවින්, ගරු ජනාධිපතිතුමා, සියළුම ආගමික නායකවරුන්, සියළුම පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්, විද්වතුන්, වෘත්තිකයන්, ඇතුළු සියළු වගකිවයුතු පාර්ශව මෙම ප්‍රජාතන්ත්‍ර විරෝධි, අත්තනෝමතික, මද්‍යසාර කර්මාන්තයට හිතැති ප්‍රතිපත්ති සැකසීම නැවැත්වීමට ක්‍රියාත්මක වන ලෙස මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය ඉතා ඕනෑකමින් ඉල්ලා සිටි.



පුබුදු සුමනසේකර
විධායක අධ්‍යක්ෂ